# සංගීතය පිළිබඳ (දෙවර්ෂ) පූර්ණ කාලීන උසස් ඩිප්ලෝමා පාඨමාලාව

## සඳහා අයදුම්පත් කැඳවීම

## 2023 අධ්‍යයන වර්ෂය සඳහා නවක සිසුන් බඳවා ගැනීම. (සිංහල මාධ්‍යය)

01. සංගීතය පිළිබඳ (දෙවර්ෂ) පූර්ණ කාලීන උසස් ඩිප්ලෝමා පාඨමාලාව (සිංහල මාධ්‍ය) ආරම්භ කිරීමට සියළු කටයුතු යොදා ඇත.

1.1 1978 අංක 1 දරන පාර්ලිමේන්තු පනතින් සංස්ථාපිත, යුනෙස්කෝවට අනුබද්ධ ජාත්‍යන්තර ප්‍රාසාංගික කලා ආයතනයේ (ITI) ශ්‍රී ලාංකේය නියෝජිත ටවර් හෝල් රඟහල පදනම විසින් ප්‍රථම වතාවට සිංහල මාධ්‍යයෙන් සංගීතය පිළිබඳ (දෙවර්ෂ ) පූර්ණ කාලීන උසස් ඩිප්ලෝමා පාඨමාලාව සඳහා 2023 අධ්‍යයන වර්ෂයට නවක සිසුන් බඳවා ගනු ලැබේ. පාඨමාලා කාලය වසර 02කි.

1.2 විශ්ව විද්‍යාල මහාචාර්යවරුන්, ආචාර්යවරුන් හා විෂය ප්‍රාමාණිකයින් විසින් මෙම පාඨමාලාවෙහි අන්තර්ගත විෂය නිර්දේශයට අදාළ දේශණ හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් ආවරණය කෙරේ. මෙම සංගීතය පිළිබඳ (දෙවර්ෂ) පූර්ණ කාලීන උසස් ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව නිමකරන විද්‍යාර්ථීන් සඳහා උපාධිය හැදෑරීමට අවස්ථාව හිමිවේ.

1.3 මෙම පාඨමාලාව ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවෙහි (SLQF) 03 වන හා 04 වන මට්ටම් ආවරණය කරනු ලබන අතර (SLQF ) 05 - 06 මට්ටම් උපාධිය මගින් ආවරණය කෙරේ.

1.4 සංගීතය පිළිබඳ (දෙවර්ෂ) පූර්ණ කාලීන උසස් ඩිප්ලෝමාව (සිංහල මාධ්‍ය) සඳහා සිසුන් 60 දෙනෙකු සුදුසුකම් මත බඳවා ගනු ලැබේ.

1.5 ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහිත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් වැඩිම ලකුණු ලබා ගන්නා අනුපිළිවෙලට සිසු සිසුවියන් බඳවා ගනු ලැබේ.

1.6 මෙම පාඨමාලාව සිංහල මාධ්‍යයෙන් පැවැත්වේ.

1.7 මහනුවර නගරය කේන්ද්‍ර කරගත් ස්ථානයක පාඨමාලාව පැවැත්වෙන අතර මෙම පාඨමාලාව සඳහා තෝරා ගන්නා සිසු සිසුවියන් නේවාසික පහසුකම් තමන් විසින් සපයා ගත යුතුය.

02. සංගීතය පාඨමාලාවට ඇතුළත් වීම සඳහා තිබිය යුතු සුදුසුකම්:-

2.1 අධ්‍යාපන සුදුසුකම්

(අ) අ.පො.ස. (සා.පෙළ) සංගීතය විෂය ඇතුළුව විෂයන් 03 කට සම්මාන සාමාර්ථ සහිතව ගණිතය ඇතුළු විෂයයන් 06 කින් සමත්ව තිබීම. ( මෙම සුදුසුකම් එක් සහතිකයකින් ඉදිරිපත් කල හැකි විය යුතුය. )

(ආ) අ. පො. ස (උ. පෙළ) විභාගයේදී සංගීතය විෂය ඇතුළුව විෂයයන් 03 එකවර සමත්ව තිබීම.

2.2 වෙනත් සුදුසුකම්

තෝරා ගැනීමේදී ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ සංගීත තරඟාවලි ජයග්‍රහණ හා වෙනත් පාඨමාලා හදාරා තිබීම සඳහා ද ලකුණු හිමිවේ.

03. **2023. 06. 09** වන දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 23ට නොවැඩි විය යුතුය.

04. මෙම පාඨමාලාවන් සංගීත විෂය ක්ෂේත්‍රයට අදාළ ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇතුළත් පාඨමාලාවක් බැවින් මේ සඳහා ඔබ තෝරා ගතහොත් පාඨමාලාවන් හැදෑරීම සඳහා ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍ය සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත බවට රජයේ වෛද්‍යවරයකුගෙන් ලබා ගත් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

05. පූජ්‍ය පක්ෂය හා රජයේ සේවයේ නියුතු අය මෙම පාඨමාලාව සඳහා සුදුසුකම් නොලබයි.

06 අයදුම්පත් කැඳවීම

6.1 මෙම පාඨමාලාව සඳහා අයදුම්පත් නිකුත් කිරීම සිදුකරනු ලබන්නේ මාර්ගගත ක්‍රමයට (online) පමණි. www.towerhall.lk.si වෙබ් අඩවියට පිවිස අයදුම්පත බාගත කර ගත හැකිය.

6.2 අයදුම්පත් ගාස්තුව රුපියල් 2, 000/- කි. අයදුම්කරු විසින් ලංකා බැංකුවේ හයිඩ් පාර්ක් ශාඛාවේ 2327541 ගිණුම් අංකය වෙත ටවර් හෝල් රඟහල පදනම නමින් ඉහත මුදල බැර කළ යුතුය. මුදල් බැර කර තැන්පත්කරු ලෙස අයදුම්කරු ලබා ගන්නා ලදුපතේ එක් ඩාරයක් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස අලවා එවීමට කටයුතු කළ යුතු වේ. අයදුම්පත් ගාස්තු සඳහා වූ මුදල් ගෙවා ලබා ගත් ලදුපත අයදුම්පත සමඟ ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ගෙවන ලද ගාස්තු කිසිදු හේතුවක් මත ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු නොකෙරේ. එසේම ලදුපතේ ඡායා පිටපතක් තමා ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

6.3 සියලු අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පමණක් **2023.06.09** වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ **"අධ්‍යක්ෂ ජනරාල්, ටවර් හෝල් රඟහල පදනම, අංක 123, සච්සිරිපාය, විජේරාම මාවත, කොළඹ 07"** ලිපිනයට එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී ප්‍රමාද වන හෝ නැති වන හෝ අයදුම්පත් පිළිබඳ ටවර් හෝල් රඟහල පදනම විසින් වගකීම් දරනු නොලැබේ.

6.4 අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවර " සංගීත පාඨමාලාවට ඇතුළත් වීම 2023 " යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය.

6.5 අයදුම්පතෙහි පිටු අංක 04 හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් හා අත්සන සහතික කිරීම අනිවාර්ය වේ.

07. පාඨමාලා ගාස්තු

| | | |
|---|---|---|
| 1 | පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමේදී | රු. 50,000.00 |
| 2 | ඉතිරි මුදල පළමුවන වාරිකය රු 30,000/-<br>දෙවන වාරිකය හා තුන්වන වාරිකය රු 25,000/- බැගින් (මෙම මුදල අධ්‍යයන වර්ෂය ඇතුළත අවස්ථා 3 කදී අධ්‍යයන වාර විභාගය සඳහා අයදුම් කිරීමට ප්‍රථම ගෙවිය යුතුය.) | රු. 80,000.00 |
| 3 | සම්පූර්ණ පාඨමාලා ගාස්තුව | රු130,000.00 |

08. දුරකථන අංක

දුරකථන අංක සඳහන් කිරීමේදී වෙනස් නොවන ජංගම දුරකථන අංකයක්, නිවසේ අංකයක් (ඇත්නම් පමණක් ) හා Whatsapp භාවිතා වන අංකය නිවැරදිව සඳහන් කළ යුතුය. පාඨමාලාවට බඳවා ගන්නා තෙක් මෙම දුරකථන අංක ඒ ආකාරයෙන්ම පැවතිය යුතු අතර යම්කිසි හේතුවක් මත වෙනස් වන්නේ නම් ටවර් හෝල් රඟහල පදනම වෙත ඒ බව නොපමාව දැන්විය යුතුය.

දිනය:- ............................................

අධ්‍යක්ෂ ජනරාල්

**ටවර් හෝල් රඟහල පදනම**

**බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**